**විසර්ජන ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2011 වර්ෂය**

---

## 1.1 විගණන විෂය පථය

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2012 දෙසැම්බර් 21 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

### මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.7,037,873,230 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 6,983,943,491 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 53,929,739 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට එකක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම විස්තරය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | ශුද්ධ ප්‍රතිපාදනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 5,541,227,000 | 6,060,648,480 | 6,788,081 | 0.11 |
| මූලධන | 831,550,000 | 977,224,750 | 47,141,658 | 4.82 |
| එකතුව | **6,372,777,000** | **7,037,873,230** | **53,929,739** | **0.77** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 11201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27,475,000 | 21,094,180 | 17,000,000 | 21,807,126 | 110,000,000 | 102,407,229 |

## 2.3 අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්

### (අ) අග්‍රිම ගිණුම්

අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමේ රු.1,553,548,264 ක්වූ හර ශේෂ තිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම්**

2011 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු.505,566,685 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2011 දෙසැම්බර් 31දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0006/0071/000 | 35,857,443 |
| 6000/0000/00/0015/0025/000 | 436,554,242 |
| 6000/0000/00/0011/0559/000 | 33,155,000 |
| **එකතුව** | **505,566,685** |

## 2.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2011 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (එ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ පහත 2.5 සිට 2.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරිම**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයට අදාල විෂය අංක 11201 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2012 මාර්තු 31 දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කල යුතු වුවත් එය විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2012 මැයි 18 දිනදීය.

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වාගෙන නොතිබීම.**

(i) 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 (IV) ඡේදය ප්‍රකාර රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ පාලන ගිණුම පවත්වා නොතිබුණි.

(ii) අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදි ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2012 ඔක්තෝබර් 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.13,166,650 ක් විය.

**(ඈ) අයවැය විචලනය**

(i) 112-02-02-2502 (3) (17) වෙනත් මුලධන වියදම් යටතේ ශ්‍රී ලංකා මහද්වීප තටාකයේ බාහිර සීමාව නිර්ණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.4,550,000 මුදලක් ඇස්තමේන්තු කර තිබූ අතර එයින් රු.3,435,000 මුදලක් වෙනත් මූලධන වැය විෂයන්ට මාරුකර ඉතිරි මුදලින් 2009 වර්ෂයට අදාලව මුද්‍රණ වියදම් සඳහා රු.1,113,246 ක මුදලක් ගෙවා තිබුණි. මේ අනුව 2011 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ඉටු වී නොතිබූ අතර 2010 වර්ෂයේද මෙම ව්‍යාපෘතිය සඳහා රු.83,000,000 වෙන්කර දී තිබුණද එයින් රු. 23,000,000 මූ.රෙ.66 මගින් මාරුකර රු. 60,000,000 ඉතිරිවී තිබුණි.

(ii) 112-02-03-2502(1) වෙනත් මුලධන වියදම් යටතේ වෙළඳ ප්‍රවර්ධන කටයුතු සඳහා රු.10,000,000 වෙන්කර තිබුණද එයින් රු.9,900,000 මූ.රෙ. 66 මගින් මාරුකර තිබූ අතර වර්ෂයට අදාල වියදම් රු.14,829 ක් විය. මේ අනුව මෙම සංවර්ධන කාර්‍යයෙහි ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.

**(ඇ) සංයුක්ත සැලැස්ම**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලස්ම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**(ඉ) වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම**

ඉහත **(ඇ)** හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පළියෙල කරන ලද සංයුක්ත සැලස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර සැලසම 2011 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ඊ) **අග්‍රිම ගිණුම**

2011 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශය වෙත රු.1,553,548,264 ක්වූ අග්‍රිම හර ශේෂ තිබුණු අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂ 1 ට අඩු | වර්ෂ 1 ට වැඩි 2 ට අඩු | වර්ෂ 2 ට වැඩි 3 ට අඩු | වර්ෂ 3 ට වැඩි | 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය හර |
|---|---|---|---|---|
| රු. | රු. | රු. | රු. | රු. |
| 194,726,622 | 783,146,800 | 208,481,472 | 367,193,370 | 1,553,548,264 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 අප්‍රේල් 30 දින වන විටද පියවා නොතිබුණු ශේෂවල එකතුව රු. 1,299,382,810 ක් විය.

(ii) 2010 වර්ෂය තුළ විදේශ දූත මණ්ඩල මගින් විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් රු.498,770,000 ක අග්‍රිම ලැබී තිබුණි. එම ලැබීම සාවද්‍ය ලෙස තැන්පත් ලැබීමක් වශයෙන් සලකා තැන්පත් ගිණුමට බැර කර නැවත අග්‍රිම ගිණුමට හර කිරීම නිසා අග්‍රිම ගිණුමේ දෙවරක් සටහන් වී තිබුණි. මේ නිසා විදේශ දූත මණ්ඩල මගින් විශ්‍රාම වැටුප් ගෙවීමේදී , විශ්‍රාම වැටුප් වැය විෂය යටතේ ගිණුම් ගත නොකර තැන්පත් ගිණුම මගින් ගෙවීම් කර තිබුණි. ඒ අනුව 2010 වර්ෂයේ රු.498,270,000 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. එම වරද 2011 දෙසැම්බර් 31 දින වන විටත් රු.121, 391,367ක විශ්‍රාම වැටුප් වශයෙන් ගිණුම්ගත කර නිවැරදි කර තිබුණත් රු. 377,378,633 ක් විශාම වැටුප සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගිණුම්ගත කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් කාර්යාලයකට හා දෙපාර්තමේන්තු දෙකක වෙනුවෙන් එකතුව රු.14,573,967 ක වැය කර තිබුණි. අදාල කාර්යාලය හා දෙපාර්තමේන්තුවල වැය විෂයන් හතරක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදන ඉක්මවීම වැලැක්වීම සඳහා සමාලෝචිත වර්ෂයේදී එම වැය විෂයන්ට අධිභාර කර අමාත්‍යාංශයේ අග්‍රිම ගිණුම හර කර තිබුණි.

(iv) අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම් වල රු.1,553,548,264 ශේෂයක් පැවැතුණු අතර එම ශේෂය 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරයට නිරවුල් කර නොතිබුණි. එම ශේෂයෙන් නිරවුල් නොකළ අත්තිකාරම් රු.688,775,103 ක් හා විදේශ දූත මණ්ඩලවල වර්ෂ අවසාන මුදල් ශේෂය එකතුව රු. 361,839,917 ක් වී තිබුණි. ඒ අනුව රු. 502,933,244 ක අග්‍රිම ශේෂය භාණ්ඩාගාරයට නිරවුල් නොකිරීමට හේතු වූ කරුණු විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(v) මුදල් රෙගුලාසි 373(4) ප්‍රකාරව විදේශයන්හි ලංකා දූත සේවාවන්ට අයත් අග්‍රිමයන්ගෙන් දෙසැම්බර් 31 දිනට ඉතිරිව ඇති ශේෂයන් දෙසැම්බර් 31 දින ගනුදෙනු පියවන අවස්ථාවේදී එරට බැංකු ගිණුමේ තිබුණු ශේෂය දැක්වෙන, බැංකු සහතිකයක් ද එම ශේෂය මුදල් පොතේ දැක්වෙන ශේෂය හා සන්සන්දනය කළ ප්‍රකාශ සටහනක්ද එක් එක් විදේශ දූත සේවාවන් මගින් භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් වෙත ඉදිරිපත් කළ බවට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

තවද, ඉහත මුදල් රෙගුලාසිය ප්‍රකාරව සුළු මුදල් අග්‍රිමයේ ගෙවන ලද වවුචර පිළිබඳ ගණන් හිලව් දෙසැම්බර් 31 දා ගිණුම් පියවීමට පළමුව ගිණුම්ගත කොට බැංකු ශේෂය පිළිබඳ සහතිකය හා සැසඳුම් ප්‍රකාශ සටහනද සමග සුළු මුදල් ශේෂයෙහි හරි වැරදි බලා ඒ බවට දූත සේවාවේ ප්‍රධානියාගේ අත්සන සහිත සහතිකයක්ද භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කළ බවට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(vi) මුදල් රෙගුලාසි 372 ප්‍රකාරව අග්‍රිම හා අතුරු අග්‍රිම මාසයකට එක් වරකට නොඅඩු වන සේ පරීක්ෂා කර නොතිබුණි.

(vii) 2011 දෙසැම්බර් 31 දින වන විට තානාපති කාර්යාලයන්හි නිවාස කුලී සඳහා දුන් අත්තිකාරම්වල එකතුව රු. 132,735,617 ක් වූ අතර එහි 1981 වර්ෂයේ සිට පැවත එන ශේෂයන් ද තිබුණි. එමෙන්ම දැනට පදිංචිකරුවන් නොසිටින නිවාස 71 ක් වෙනුවෙන් එකතුව රු.9,662,154 ක් වූ නිරවුල් නොවූ අත්තිකාරම් තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම අත්තිකාරම් නිරවුල් කර නොතිබූ අතර අමාත්‍යාංශයේ හා තානාපති කාර්යාලවල කිසිදු තොරතුරක් නොමැතිව අවස්ථා 34 කදී ලබාදුන් නොපියවූ ගමන් වියදම් අත්තිකාරම් රු. 5,874,998 ක ශේෂයක් හා අවස්ථා 145 කදී ලබාදුන් නොපියවූ ගෙවල් කුලී අත්තිකාරම් රු. 20,124,538 ක ශේෂයක් සම්බන්ධයෙන් අයකර ගැනීම හෝ පොත් වලින් ඉවත් කිරීමට අදාල ක්‍රියාමාර්ග දීර්ඝ කාලයක සිට ගෙන නොතිබුණි.

(ඩ) **පොදු තැන්පත් ගිණුම**

සමාලෝචිත වර්ෂය තුළ පොදු තැන්පත් ගිණුම් 05ක් ක්‍රියාකාර තත්ත්වයේ තිබූ අතර 2011 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 505,566,685 ක් විය. පහත සඳහන් නිරීක්ෂණයන්ද කරනු ලැබේ.

(i) කාල විශ්ලේෂණ හා කේවල ශේෂ ලැයිස්තු විගණනයට ඉදිරිපත් නොකල අතර ලේඛනද නිරවුල්ව පවත්වා නොතිබුණි.

(ii) 6000/0000/00/0003/0180/000 අංක දරන තැන්පතු ගිණුමට සමාලෝචිත වර්ෂය තුළදී රු.158,999 ක් බැරකර තිබුණද බැරකිරීමට අදාල විස්තර ඉදිරිපත් නොකෙරිණි.

(iii) 6000/0000/00/0015/0025/000 ගිණුම යටතේ උප ගිණුමක් වූ 15/25/01 අංක දරන පොදු තැන්පත් ගිණුමේ 2011 දෙසැම්බර් 31 දිනට ශෙෂය රු.33,679,456 ක් වූ අතර එම ගිණුමට

පමණක් කේවල ශේෂ ලැයිස්තුවක් ඉදිරිපත් කර තිබුණි. තැන්පතු ලේඛණය අනුව වර්ෂයේ ආරම්භක ශේෂයෙන් 2011 දෙසැම්බර් 31 දිනට නිරවුල් කර නොතිබු රු.18,681,279 ක්වු ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට වු ශේෂය තළ ඇතුළත්ව නොතිබුණි. තවද, 2011 වර්ෂයට අදාලව ලේඛණය අනුව වර්ෂ අවසානයට නිරවුල් නොවු රු. 505,421 ක්වු තැන්පතු ශේෂයක් පැවතියද එම ශේෂයද 2011දෙසැම්බර් 31 දිනට වු ශේෂය තුළ ඇතුළත්ව නොතිබුණි.

(ඌ) **නිරවුල් නොකල ශේෂ**

2011 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකල ශේෂයන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. උතුරු මිතුරු යාල් දේවි වැඩසටහන වෙනුවෙන 2011 අගෝස්තු 08 දින වන විට විදේශ දුත මණ්ඩලවලින් රු.5,696,170 ක මුදලක් ලැබී තිබුණි. මෙයින් 2010 වර්ෂයේ ලැබු රු.3,862,793 ක මුදල මෙම වැඩසටහන වෙනුවෙන් භාර නොදී පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි. ඉතිරි රු. 1,833,377 ක මුදල පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ii. විදේශ කටයුතු අමාත්‍යාංශය 2011 පොදු තැන්පත් ලේඛන පරීක්ෂාවේදි නිරවුල් කළ යුතු වු විශ්‍රාම පාරිතෝෂිත, නොගෙවු වැටුප් හා මියගිය අය වෙනුවෙන් ලැබු වන්දි මුදල් වශයෙන් එකතුව රු. 1,081,052 ක් 2012 අගෝස්තු වන විටද අදාල පුද්ගලයින් වෙත නිරවුල් කර නොතිබුණි.

**(එ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

(i) විෂය අංක 11201 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් පිළිබඳ 2011 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිග හිට තිබුණු ශේෂ වල එකතුව රු.8,844,809 වු අතර, හිඟ හිට ශේෂ අයකර ගැනිමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුණි. මෙම ශේෂය තුල වසර 3කට වැඩි හිඟ හිට තිබු ශේෂ එකතුව රු.2,875,674 ක් විය.

(ii) එකතුව රු.2,372,275 ක් වු හඳුනා නොගත් ශේෂයන් හඳුනා ගැනිමටත්, එකතුව රු.201,177 ක් වු වැටුප් රහිත නිවාඩු ලබා ඇති නිලධාරින්ගේ ශේෂයන් අයකර ගැනිමටත්, එකතුව රු.72,712 ක් වු නිවැරදි කළයුතු ශේෂය නිවැරදි කිරිමටත් 2013 පෙබරවාරි 28 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කරන ලද ගිණුම් වලට අනුව නිලධාරින් 59 දෙනෙකුගේ රු.344,628 ක බැර ශේෂයක් විය. මෙම නිලධාරින්ගේ ආරම්භක ශේෂයන් හා ලැබුණු මුදල්

නිවැරදි ගැළපුම් කර අවසාන ශේෂයන් ඉදිරියට ගෙන ආ යුතු වුවත් එලෙස සිදු නොකර වැඩිපුර අයකර ගැනීම් ලෙස ගිණුම් ගත කර ඇති බව නිරීක්ෂණය විය.

(iv) පොදු තැන්පත් ගිණුමේ ගිණුම් දෝෂ ලෙස සඳහන් කර විදේශ දූත මණ්ඩල කාර්යමණ්ඩලයේ 87 දෙනෙකුගෙන් රු. 619,425 ක්වූ ණය වාරික මුදල් හා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ 111 දෙනෙකුගෙන් වැඩිපුර අයවූයේ යයි සඳහන්ව රු. 849,161 ක් වූ මුදල් නිරවුල් නොකර අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.5 අනුකූල නොවීම්

### (අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව. | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(i) ආයතන සංග්‍රහය** | | |
| XIV පරිච්ඡේදයේ 27:6 වගන්තිය | 22,700,567 | අමාත්‍යාංශය විසින් නිලධාරීන් වෙත ලබා දී තිබුණු වසර 1-16 දක්වා වූ කාල පරාසයක ගමන් වියදම් අත්තිකාරම් පියවා නොතිබුණි. |
| 27:8 වගන්තිය | 467,474 | නියැදි පරීක්ෂාවකට අනුව නිලධාරීන් දෙදෙනෙකුට 1997 වර්ෂයේදී ගෙවන ලද රු.182,946 ක් සහ රු.79,273 ක් වූ අත්තිකාරම් පියවා නොතිබියදී එකී නිලධාරීන් දෙදෙනාට පිළිවෙලින් රු.179,557 ක සහ රු.25,698 ක්වූ අත්තිකාරම් තව දුරටත් 1998 වර්ෂයේදී ගෙවා තිබුණි. එකතුව රු.467,474 ක් වූ එකී අත්තිකාරම් ගෙවා වර්ෂ 15ක කාලයක් ගතවී තිබුණද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ii) මුදල් රෙගුලාසි** | | |
| මු.රෙ. 212 (2) (v) | 323,178 | 2007 වසරේ සිට 2011 වර්ෂය දක්වා නිලධාරීන් 6 දෙනෙකු වෙත ලබාදුන් එකතුව රු.323,178 ක් වූ වැටුප් අත්තිකාරම් පියවාගෙන නොතිබුණි. |

## 2.6 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

### ගැලපුම් කළ යුතු ශේෂ

විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2011 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකල කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව 2011 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| දූත මණ්ඩලය | විදේශ ව්‍යවහාර මුදල් | බැංකුවට ඉදිරිපත් නොකල මාස 06 ඉක්මවූ චෙක්පත් වල වටිනාකම. |
|---|---|---|
| කැන්බරා | ඕ.ඩො. | 202 |
| කැන්බරා | ඕ.ඩො | 404 |
| ප්‍රැන්ක්ෆර්ට් | යුරෝ | 62 |
| නවදිල්ලිය | ඉ.රු | 341,801 |
| නිව්යෝක් | ඇ.ඩො | 1057 |
| ඔටාවා | කැ.ඩො. | 46,416 |
| කටාර් | රියාල් | 51,365 |
| සෝල් | වොන් | 180,000 |
| ටොරොන්ටෝ | කැ.ඩො. | 1,079 |
| වොෂින්ටන් | ඇ.ඩො | 12,746 |

## 2.7 පාඩු හා හානි

විසර්ජන ගිණුමෙහි පෙන්වා තිබූ විදේශ තානාපති කාර්යාල වලට අදාල රු.21,039,376 ක පාඩු සම්බන්ධයෙන් මු. රෙ. 104 හා 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2011 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 255 | 209 | 46 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (iii) | ද්විතියක මට්ටම | 503 | 422 | 81 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 623 | 606 | 17 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 06 | 05 | 01 |
| | එකතුව | **1390** | **1244** | **146** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරන ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 146 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.